**කාර්මික තාක්ෂණ ආයතනය -** 2021

**---------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කාර්මික තාක්ෂණ ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙමෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නාලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයනලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රමිත අංක 09 හි (35) වගන්තිය අනුව ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීමේ ක්‍රමය (FIFO) හෝ හරිත සාමාන්‍ය ක්‍රමය (WAC) යන ක්‍රම දෙකෙන් එක් ක්‍රමයක් තෝරාගෙන භාණ්ඩ තොගයේ පිරිවැය අගය කළ යුතු වුවත් එසේ කටයුතු නොකොට සරල සාමාන්‍ය පිරිවැය ක්‍රමය භාවිතා කර ආයතනය විසින් 2021 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ තොගය රු.28,685,144 කට අගය කර ගිණුම්ගත කර තිබුණි. | පවතින පරිගණක පද්ධතිය තුල හරිත සාමාන්‍ය පිරිවැය අනුව තොග ආගණනය සිදු කිරීමට අවශ්‍ය පහසුකම් නොමැති බැවින් සරල සාමාන්‍ය ක්‍රමය තොග ආගණනය සඳහා යොදාගනු ලබයි. මෙම පහසුකම ඇති නව පරිගණක පද්ධතිය මේ වන විට ස්ථාපිත කර ඇත. 2022 වසරේ සිට හරිත සාමාන්‍ය ක්‍රමයට තොග ආගණනය සිදු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව භාණ්ඩ තොගයේ පිරිවැය ගණනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රමිත අංක 03 අනුව වත්කම්වල ඵලදායී ජීව කාලය නිවැරදි ලෙස හඳුනාගෙන ගිණුම්කරණ ඇස්තමේන්තුවල නිවැරදි කිරීම් සිදු කිරීම කළයුතු වුවත් ඒ අනුව කටයුතු නොකිරීම නිසා සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු දැනටත් භාවිතා කරනු ලබන පිරිවැය රු.878,546,346 ක් වූ ස්ථාවර වත්කම්වල ඵලදායි ජීවිත කාලය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතුකර නොතිබුණි. | සම්පූර්ණයෙන් ක්ෂය කළ එහෙත් දැනට භාවිතා කරන වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද මෙම වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා පවතින ප්‍රායෝගික අපහසුතා (තාක්ෂණික විශේෂඥයින්ගේ සේවය) මත හා රට තුළ පැවති වාතාවරණය මත මෙය සිදුකිරීම අපහසුවී ඇත. එනමුත් ඒ සඳහා ප්‍රවීන පළපුරුදු සේවා දායකයෙකුගේ සේවය ලබාගැනීමට කටයුතු කරමින් සිටී. | වත්කම්වල ඵලදායී ජීව කාලය නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |
| (ඇ) ප්‍රමිත අංක 02 හි සඳහන් නියමයන්ට අනුකූල නොවන පරිදි ඉකුත් වර්ෂයන් තුළ මිලදීගෙන සමාලෝචිත වර්ෂයේදී වත්කම් ගිණුම් අතර මාරුකර තිබුණු රසායනාගාර උපකරණවල වටිනාකම වූ රු.225,234,416 ක් සමාලෝචිත වර්ෂයේ මුදල් යෙදවීමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | මෙම වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති කෙරීගෙන යන වැඩ මගින් අඩුකොට ගළපා ඇත. | ප්‍රමිත ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාළ ගණුදෙනු පමණක් යොදාගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට පැවති හඳුනා නොගත් සෘජු බැංකු බැර කිරීම් රු.12,897,354 ක් සමාලෝචිත වර්ෂයේදීද ආයතනය විසින් හඳුනා ගැනීමට කටයුතු නොකර ගෙවිය යුතු වියදම් ලෙස ජංගම වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම තත්වය මඟහරවා අදාළ සෘජු බැංකුගත කිරීම් හඳුනා ගැනීමට හා ගිණුම්ගත කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග කිහිපයක් 2021 අග භාගයේ සිට Smart Online Payment Gate Way System (WEB PAY, SMART PAY, LANKA QR , Internet payment gateway and APP Biller) ක්‍රියාවට නගා ඇත. තවද නිසි ඉන්වොයිස් අංකයක් නොමැතිව අපගේ ගිණුමට මුදල් රැස්කිරීමට අවකාශ නොදීමට බැංකුව දැනුවත්කර ඇත. මෙම රු. 12,897,354 අගය 2022 මැයි මාසය වන විට රු. 5,270,109.39 දක්වා අඩුකරගෙන ඇත. ඉතිරි සෘජු බැංකුගත කිරීම් තහවුරුකර ගැනීමට කටයුතු කරමින් පවතී. | හඳුනා නොගත් සෘජු බැංකු බැර කිරීම් නිසි පරිදි හඳුනා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණය ගැති කාල විශලේෂණයට අනුව ණය ගැති ශේෂය රු.11,124,306 ක් වුවද මූල්‍ය ප්‍රකාශන තුළ (ගිණුම් සටහන් 18A) ණය ගැති ශේෂය රු.15,718,055 ක් ලෙස දක්වා තිබීම නිසා ණය ගැති කාල විශ්ලේෂණයේ හා මූල්‍ය ප්‍රකාශනයේ ණය ගැති ශේෂ අතර 4,593,749 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේ වුවත් එකී වෙනස්කම් පිළිබඳ පරීක්ෂාකර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | මෙම වෙනස නිවැරදි කිරීමට පරිගණක මෘදුකාංග සමාගමට දැනුම් දී ඇත. මේ වන විට අදාළ නිවැරදි කිරීම කිරීමට කටයුතු කරමින් පවතී. | ණය ගැති කාල විශලේෂණයේ ශේෂය හා ණයගැති ශේෂය එකම අගයක් වන පරිදි අදාළ ශේෂ පවත්වාගෙන යායුතුය. |
| (ඇ) ආයතනයෙන් සේවාවන් සපයා ගැනීම සඳහා ගණුදෙනුකරුවන් විසින් මාර්ගගත ක්‍රමයට බැංකුවේ තැන්පත් කරන ලද මුදල් බැංකුවේ තැන්පත් කරන අවස්ථාවේදී හා එම තැන්පත්වලට අදාල තැන්පත් කුවිතාන්සිවල මුල් පිටපත් ආයතනයට ඉදිරිපත් කරන අවස්ථාවේදී එකම ගණුදෙනුව පිළිබඳ දෙවරක් ලෙජරයේ සටහන් වීම හේතුවෙන් ණයගැති ශේෂය රු.7,602,974 කින් අඩුවෙන්ද මුදල් ශේෂය එම වටිනාකමෙන් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති, එකී වටිනාකම නිශ්කාශනය නොවූ තැන්පතු ලෙස බැංකු සැසඳුම් ප්‍රකාශනය තුළ ඇතුළත්කර බැංකු සැසඳුම පිළියෙලකර තිබුණි. | මෙය හුදෙක් 2020 හා 2021 වසර තුළදී පැවති COVID -19 වාතාවරණය මත සිදු වූයේ වැඩිමනත් පිරිසක් මාර්ගගත ක්‍රමයට මුදල් තැම්පත් කිරීම හා අදාළ සේවක මණ්ඩලය නිවසේ සිට කටයුතු කිරීම මඟින් අවශ්‍ය සන්නිවේදන කටයුතු නිසි පරිදි සිදු කිරීමට පැවති ප්‍රායෝගික අපහසුතා හේතුවෙනි. මෙම තත්වය මේවන විට නිසි පරිදි ගලපා ඇත. | ණයගැතියන්ගෙන් මාර්ග ගත ක්‍රමයට මුදල් ලැබීම් ද්වීගණනය නොවන පරිදි කටයුතු කළ යුතු අතර බැංකු සැසඳුම නිසි පරිදි පිළියෙළ කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට වර්ෂ 03 ක සිට වර්ෂ 16 ක් දක්වා කාල පරාසයක සිට ගෙවිය යුතු ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 8,039,067 ක් වූ ශේෂ 08 ක් සඳහා ශේෂ තහවුරු කර ගැනීමට අදාළ තොරතුරු/උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීම නිසා මෙකී වගකීම් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණයකළ නොහැකිවිය. | Bank Rejection, Maintenance Expenditure (coir project) Re-Banking සඳහා අදාළ ශේෂ තහවුරු වසර 10 කටත් වඩා පැරණි අතර මෙම ශේෂ තහවුරු කර ගැනීමට අදාළ විස්තර සපයා ගැනීම අපහසුය.<br>Refund Customer over payment, 2015 VAT over payment මෙම ශේෂ VAT බදු ප්‍රතිශත වෙනස්වන අවස්ථා වලදී ගෙවන ලද බදු මුදල් වන අතර එසේ ගෙවන ලද සියළුම අගයන් අදාළ පාරිභෝගිකයන්ගේ ඉල්ලීම මත නැවත ගෙවීම සඳහා මෙසේ වෙන් කිරීම් කර ඇත. | මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන ශේෂ තහවුරු කිරීම් ආයතනය සතුවන පරිදි කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | DMS30Resigned/Present Employee අගය DMS30 චක්‍රලේඛය අනුව එවකට සිටින ලද නිළධාරීන්ගේ තනතුරුවල ශ්‍රේණිය වෙනස්වීම මත ගෙවීමට සිදුවන හිඟ මුදල් ගෙවීමට කරන ලද වෙන් කිරීමකි. | |
| (ඉ) 2019 අගෝස්තු මස දී යුනිඩෝ ප්‍රදාන (UNIDO Grant) හරහා ආයතනයේ ඇසුරුම් ද්‍රව්‍ය රසායනාගාරය (Packing Material Lab) වෙත ලැබී තිබුණු විද්‍යාගාර උපකරණ 19 ක වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශන වලට සහ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබූ අතර එම උපකරණ ක්ෂයකිරීමේ ක්‍රියාවලියෙන්ද බැහැරවී තිබුණි. ඉහළ වටිනාකමකින් යුත් මෙම උපකරණවල වටිනාකම තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරුද විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | ඇසුරුම්ද්‍රව්‍ය (Packaging Laboratory) රසායනාගාරය වෙත UNIDO Grant ප්‍රධානයක් ලෙස උපකරණ 19 ක් 2019 දී ලැබුණු අතර, එම උපකරණ පෙට්‍රෝලියම් රසායනගාරය තුල ඒ වන විට තාවකාලිකව ගබඩා කරන ලදී. මන්ද, ඇසුරුම් රසායනාගාරයේ ඉදිකිරීම් 2019 වර්ශයේ පටන් ගන්නා ලද අතර ඒ වන විටත් නිම නොවී තිබුණු බැවිනි. ඒ අනුව අදාල උපකරණ Commissioning 2019 වසරේදී සිදු කලද, එම උපකරණ ඇසුරුම් රසායනාගාරය ස්ථාපිත කරනලද්දේ 2021 වසරේ අගභාගයේ දීය (Renovation අවසාන කරන ලද්දේ 2021 වසරේදීය).<br>ඒ අනුව මෙම රසායනාගාර හා එහි වූ වත්කම් භාවිතය 2022 වසරේ සිට ක්‍රියාත්මක වේ. වත්කම් පිහිටි ස්ථානය හා වත්කම් නිසිපරිදි ස්ථානගත කිරීම 2021 අග වන විට සම්පූර්ණ නොවී තිබුණු බැවින් මෙම ප්‍රදානයන් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කරන ලද්දේ 2022 වසරේදීය. ඒ අනුව මෙම ස්ථාවර වත්කම් ක්ෂය කිරීම වත්කම් ලැබුනු දින සිට 2021 වසර දක්වා නිසි ගැලපීම් සමුච්චිත අරමුදල හරහා සිදුකර ඇත. | ආයතනයට ලැබෙන ස්ථාවර වත්කම් නිසි පරිදි ස්ථාවර වත්කම් ලේඛනයටත් මූල්‍ය ප්‍රකාශනයේත් ඇතුළත් විය යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය<br>-------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>------------------------------------------- | නිර්දේශය<br>------------- |
|---|---|---|
| (අ) ලැබියයුතු ශේෂ තුළ පවත්නා වර්ෂ 1 ක සිට වර්ෂ 07 ක් අතර කාලයක් පැරණි එකතුව රු. 14,535,683 ක් වූ විවිධ ණයගැති ශේෂ සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම්වල කොන්දේසි කඩකළ නිලධාරින් 21 | විද්‍යා හා තාක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය කුලී පදනම මත කාර්මික තාක්ෂණ ආයතනයේ සිටි කාලයට ආදාලව ලැබිය යුතු කුලිය වන අතර මෙය ලබා දෙන ලෙස කිහිපවිටක්ම ලිඛිතව ඉල්ලීම්කර ඇත.<br>කළමනාකරණ තොරතුරු පද්ධතිය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ඔක්සිජන් හවුස්, | ලැබිය යුතු මුදල් ලබා ගැනීමට ක්‍රියාකළ යුතුය. |

| | |
|---|---|
| දෙනෙකුගෙන් අයවිය යුතු රු.17,044,754 ක් වූ මුදල 2021දෙසැම්බර් 31දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | WHT Tax, VAT WHT යන අයිතම වසර 10 කට පෙර සිට පැවතෙන ශේෂයන් වන අතර මෙම ශේෂ අයකර ගැනීම අසීරු වී ඇත.<br>ආපසු ගෙවිය හැකි ගුවන් ටිකට්පත් සඳහා මුදල් ගෙවන ලෙසත් මුදල් නොගෙවන්නේනම් නීතිමය කටයුතු සඳහා යොමුවන බවට අදාල පාර්ශව ලිඛිතව දැනුවත් කර ඇත.<br>අයවිය යුතු රු.17,044,754 ක මුළු මුදලින් රු.4,020,392 ක මුදල නිළධාරීන් 17 දෙනෙකුට සම්බන්ධ වන අතර ගිවිසුම් කඩකළ නිළධාරීන් ගෙන් අදාළ මුදල් අයකර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග සිදු කළමුත්, එම ක්‍රියාමාර්ග ව්‍යාර්ථ වුයේ එම නිළධාරීන් දිවයින හැර ගොස් සිටි බැවිනි. ඔවුන්ගේ බොහෝ ඇපකරුවන්ද දිවයිනෙන් බැහැරගොස් සිටින අතර ඇතැමෙක් ජීවතුන් අතරද නැත.<br>ගිවිසුම් කඩකළ නිළධාරීන්ගේ කාල විශ්ලේෂණයක් පහත දක්වා ඇත.<br>වසර 30 ට වැඩි නිළධාරීන් 04<br>වසර 20 ට වැඩි නිළධාරීන් 08<br>වසර 10 ට වැඩි නිළධාරීන් 06<br>රු.12,541,165 ක් වටිනා ගිවිසුම් කඩකළ නිළධාරිනියන් දෙදෙනා සඳහා අවශ්‍ය කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව සමඟ මේ වන විටත් සිදු කෙරෙමින් පවතී.<br>මින් එක් නිලධාරී මහතෙකු ගිවිසුම් ප්‍රකාරව මෙම මුදල ගෙවීමට කටයුතු කර ඇත. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි සංග්‍රහයේ 507(2) වගන්තිය | දෙසැම්බර් මස 31 වැනි දිනට සෑම ස්ථාවර වත්කම් විෂයකම පැවැත්ම හරි වැරදි බලා ඒවායේ තත්වය සටහන් කළ යුතුය. මෙම වත්කම් පිළිබඳ ප්‍රකාශයක් පිළියෙළ කොට වාර්ෂික ගිණුම් සමඟ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ආයතනය විසින් 2021 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ | 2021.12.31 දිනට අදාල ස්ථාවර වත්කම් සත්‍යාක්ෂණ කටයුතු COVID-19 (කොරෝනා) වසංගතය නිසා ආයතනය තුල නියමාකාරයෙන් ක්‍රියාත්මක කිරිමට නොහැකිවිම හේතුවෙන් සහ මෑතකදී මුහුණ දිමට සිදු වූ | භාණ්ඩ සමීක්ෂණය කටයුතු නියමිත දින වකවානුවල සිදුකර අදාළ වාර්තා ඉදිරිපත්කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමීක්ෂණය විගණිත දිනය වූ 2022 අගෝස්තු 26 දින වන විටත් සිදු කර නොතිබුණි. | ඉන්දන අර්බුදය සහ රටෙ පැවති තත්වය මත දින 5ම රාජකාරි කටයුතු කිරිමට නොහැකි විම නිසාත් එම ස්ථාවර වත්කම් සතොයක්ෂණ කටයුතු නියමිත කාලය තුළ ඉටුකිරීමට නොහැකි විය. එම කටයුතු මේ වනවිට ආරම්භ කර ඇති අතර එය ඉතා ඉක්මණින් (2022 සැප්තැම්බර් මාසය තුල) නිම කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ආ)2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය හා පොදු 267 ආකෘතිය | ආයතනය සතු වාහන වල දැවෙන ඉන්ධන ප්‍රමාණය සම්බන්ධයෙන් සෑම ඉන්ධන පරීක්ෂාවකටම මාස 12 ක කාලසීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් සිදුකර ඒ අනුව ධාවන සටහන් පවත්වාගෙන යාමටත් ඉන්ධන දහනය සම්බන්ධයෙන් ලොග් සටහන් පොතෙහි අදාල පරීක්ෂාව සිදු කළ දිනය, ලීටරයකට ධාවනය කළ දුර ප්‍රමාණය හා ඉන්ධන පරීක්ෂාව සිදුකළ නිලධාරියාගේ අත්සන ආදී විස්තර සටහන් කළ යුතු වුවත් පරීක්ෂාවට ලක්කළ ලොග් සටහන් පොත් 22 ක් අතුරින් කිසිදු පොතක ඉන්ධන පරීක්ෂාවන් සිදු කල බවට අදාළ සටහන් ඇතුළත්කර නොතිබුණි. | මින් පෙර වාහන ඉන්ධන දහන පරික්ෂාව අභ්‍යන්තර විගණන අංශයේ අධීක්ෂණයද සහිතව ක්‍රමවත්ව සිදු කල අතර පැවති ප්‍රායෝගික ( දැනට භාවිතයේ පවතින වාහන වලින් බහුතරයක් අවුරුදු 10 කට , 15 කට පමන පැරණි වාහන බැවින් ) හා කාලීන ගැටළු (කොරෝනා වසංගතය හා රටතුල පවතින ඉන්ධන හිඟතාවය) හමුවේ එම කටයුතු අඩාල වූ අතර වර්ථමානයේ පවතින තත්වය සැලකිල්ලට ගෙන කඩිනමින් එම කටයුතු ක්‍රමවත්ව කිරීමට කටයුතු කරනු ලැබේ. | වාහනවල ඉන්ධන පරික්ෂාවන් නිසි පරිදි සිදුකර ලොග් සටහන් පොත්වල අවශ්‍ය තොරතුරු සටහන් කිරීමට කටයුතු කල යුතුය. |

**1.8 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.2,448,085 ක් වූ බැංකු ගිණුම් 04 ක් අක්‍රිය බැංකු ගිණුම් ලෙස වසර 06 කට අධික කාලයක සිට පවත්වාගෙන ගොස් තිබුණද එම මුදල් ආයෝජනය කිරීමට හෝ | අංක 000-2876-229 දරන ගිණුම කොහු ආශ්‍රිත ව්‍යාපෘතියක් වූ coir ව්‍යාපෘතිය සඳහා භාවිතා කළ අතර , අංක 000-9283-122 ගිණුම හා 000-8174-439 ගිණුම | අක්‍රිය බැංකු ගිණුම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| කටයුතු කර නොතිබුණි. | EEPEX ව්‍යාපෘතියේ ගිණුම් වන අතර මෙය 2022 වසරේ සිට ක්‍රියාත්මක GIZ ව්‍යාපෘතිය සඳහා භාවිතා කරනු ලබයි. අංක 76175979 මෙය GIZ සමඟ පැවති ව්‍යාපෘතියට අදාල බැංකු ගිණුම් වන අතර 2022 වසරේ සිට GIZ සමඟ නව ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර ඒ සඳහා මෙම ගිණුම උපකාර කර ගත හැක. | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.47,679,836 ක අතිරික්තයක්වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.11,065,299 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 58,745,135 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මූල්‍ය ප්‍රතිඵලය වර්ධනයට පුනරාවර්ථන ප්‍රදාන රු.9,467,000 කින් හා ආදායම රු.61,573,883 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංවර්ධිත රටවල උසස් ඖෂධ රසායනාගාරවලට සමගාමීව පහසුකම් සහිතව ජීඑල්පී (GLP) තත්ත්වය ඇතුළුව ප්‍රතීතනය ලත් අති නවීන ඖෂධ රසායනාගාරයක් භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් රු.99,423,972 ක් වියදම් දරා ආයතනය තුල 2019 සිට පවත්වාගෙන ගොස් තිබුණද දිවයිනේ ඇති රෝහල් පද්ධතියද ඇතුලත්ව සියළුම බටහිර ඖෂධ සපයාගැනිම හා බෙදාහැරීම් කිරීමේදී ජාතික ඖෂධ නියාමන අධිකාරිය මගින් උක්ත රසායනාගාරයේ පුළුල් සේවාවන් ලබා ගැනීමට කටයුතුකර නොතිබුණි. මෙම නිසා රසායනාගාරය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූ ශ්‍රී ලංකාව තුල ඖෂධ අංශයේ සංවර්ධනය සඳහා ස්වාධීන ප්‍රතීතනයලත් තෙවන පාර්ශවීය පරීක්ෂණාගාරයක් ලෙස මෙම රසායනාගාරය මෙතෙක් භාවිතා නොවන බව නිරීක්ෂණය විය. තවද, එහි අපේක්ෂිත ප්‍රධාන අරමුණු අතර වූ ඖෂධ විශ්ලේෂණය සඳහා දේශීයව / ජාත්‍යන්තරව පිළිගත් විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් බවට පත් කිරීම, ක්ෂේත්‍ර ඖෂධවල අවශ්‍ය සියලු හෝඩුවාවන් රසායනිකව හා භෞතිකව විශ්ලේෂණය කිරීම, ඖෂධවල ගුණාත්මක භාවය සම්බන්ධයෙන් ජාතික ගැටළු විසඳීම හා ඖෂධවල දේශීය | ඖෂධ රසායනාගාරය දේශීයව නිෂ්පාදනය කරන සමාගම් විසින් ආනයනය කරනු ලබන ඖෂධ නිෂ්පාදන පරීක්ෂා කිරීම විධිමත් කිරීම සඳහා රජයේ මඟපෙන්වීම සහ මූල්‍ය අනුග්‍රහය මත පදනම්ව රසායනාගාරය ආරම්භ කරන ලදී. ජාතික ඖෂධ නියාමන අධිකාරීය මූලික ලියාපදිංචිය සහ පසුව වාර්ෂික ලියාපදිංචිය සඳහා ඖෂධ නිෂ්පාදනවල ගුණාත්මකභාවය පිළිබඳ තුන්වන පාර්ශවයක ස්වාධීන පරීක්ෂණ අනිවාර්ය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදුකරනු ඇතැයි අපේක්ෂාකරන ලදී. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය යනු ඖෂධ පරීක්ෂණ සම්බන්ධයෙන් නියාමන බලතල ඇති සංවිධානයයි. තෙවන පාර්ශවීය පරීක්ෂණය අනිවාර්ය කර නොමැති බැවින්, ඖෂධ නිෂ්පාදකයින් සහ ආනයනකරුවන් තම නිෂ්පාදන පරීක්ෂා කිරීම සඳහා ITI වෙත නොපැමිණේ. එබැවින් අදාළ | ජාතික ඖෂධ නියාමන අධිකාරිය හරහා මෙම රසායනාගාරය තෙවන පාර්ශවීය පර්යේෂණාගාරයක් ලෙස භාවිතයට ගැනීමට කටයුතු කල යුතු අතර රසායනාගාරය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| රෙගුලාසි හා මාර්ගෝපදේශ ශක්තිමත් කිරීමද ඉටු වී නොතිබුණි. | නියාමන අධිකාරිය විසින් අනිවාර්ය අවශ්‍යතාවයක් වන රාජ්‍ය තෙවන පාර්ශවීය ස්වාධීන පරීක්ෂණය ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.<br>නියාමන රාමුවේ ඉහත වෙනස්කම් ක්‍රියාත්මක වන තුරු කාර්මික තාක්ෂණ ආයතනයට ඖෂධ සහ ලිහිසිතෙල් පරීක්ෂණ යන දෙකෙහිම සත්‍ය පරීක්ෂණ අවශ්‍යතාවලින් ඉතා කුඩා කොටසක් පමණක් ලැබෙනු ඇත. | |
| (ආ) 2016 අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකාවේ මහජන උපයෝගිතා කොමිසමේ (PUCSL) නියමයන්ට අනුකූලව තුන්වන පාර්ශවීය බණිජතෙල් නිෂ්පාදනයේ පරීක්ෂාවන් සිදුකිරීම පිණිස උපකරණ අත්පත්කර ගැනීමට හා සවිකිරීමට රු.මිලියන 117.7 ක් වැයකර ස්ථාපනය කර තිබූ බණිජතෙල් හා ලිහිසිතෙල් රසායනාගාරය සඳහා බණිජතෙල් සාම්පල් ලැබීමේ ක්‍රමවේදයක් නිර්මාණය වී නොතිබීම නිසා රසායනාගාරය පිහිටුවීමේ මූලික කර්තව්‍ය ඉටුවී නොමැතිබව නිරීක්ෂණය විය. | අපගේ මෙම රසයනාගාරය සඳහාද නියාමන අධිකාරී (Regularity Authority) බලයක් නොමැති බැවින් සියලුම සාම්පල අප රසායනාගාරයට නොලැබේ. මෙම ක්‍රියාවලිය මූලික පරමාර්ථය තුළ පවතින අතර එය ජාතික අවශ්‍යතාවයක් බැවින් ඒ සඳහා බලශක්ති අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ පූර්ණ කැපවීම මත අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි හැකි ඉක්මනින් ක්‍රියාවට නැංවීම සඳහා කටයුතු සිදුවෙමින් පවතී. | අදාළ ආයතන සමඟ සම්බන්ධවී බණිජතෙල් පරීක්ෂාවන් සිදුකරන රසායනාගාරයක් ලෙස ක්‍රියාත්මක විමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) Resistor උපකරණයේ උෂ්ණත්වය නියමිත තත්වයෙන් පවත්වා ගැනීම සඳහා භාවිතා කළ හැකි UNIDO Grant හරහා ආයතනයට ලැබී තිබූ රු.1,763,040 ක වටිනාකමින් යුතු Programmable Fluid Bath උපකරණය 2002 සැප්තැම්බර් 04 වන දින ස්ථාවර වත්කමක් ලෙස ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත්කර ඉලෙක්ට්‍රෝණික් පර්යේෂණාගාරයේ තිබූ නමුත් 2006 වර්ෂයේ පමණ සිට පර්යේෂණ කටයුතු සඳහා භාවිතයට නොගෙන නිෂ්කාර්යයව පවතින බවට නිරීක්ෂණය විය. | පහත සඳහන් කරුණු නිසා මෙම තාපකය (Programmable Fluid Bath) වර්තමානයේ භාවිතා නොකරයි.<br>1. මෙම තාපකය නවීන ප්‍රතිරෝධක ක්‍රමාංකනය සඳහා අවශ්‍ය නොවේ.<br>පැරණි ක්‍රමය අනුව ප්‍රතිරෝධක ක්‍රමාංකනය කරන ලද්දේ තරමක් ඉහළ ධාරාවක් (>5A) සපයා ප්‍රතිරෝධයේ අග්‍ර අතර ඇතිවන විද්යුත් ගාමක බලය මැනීමෙනි. මේ අධි ධාරාව නිසා ප්‍රතිරෝධ රත්වීම සිදුවේ. මේ නිසා ප්‍රතිරෝධ උෂ්ණත්වයට සංවේදී බැවින් එහි ප්‍රතිරෝධය වෙනස් විය හැක. එබැවින් එම උෂ්ණත්වය පාලනය කිරීම සඳහා ඒවා මෙම තාපකය තුළ ගිල්වා තබයි. තාපකයේ ආධාරයෙන් ප්‍රතිරෝධ නියත උෂ්ණත්වයක පවත්වා ගනී. නමුත් වර්තමානයේ විද්‍යාගාරය<br>සතුව ඇති අති සංවේදී 8.5 මල්ටිමීටරය මගින් ඉතා සුලු ධාරාවක් (<100Ma) ලබා | වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ගත හැකිවන පරිදි ඒවා උපයෝජනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| | දීම මඟින් මෙම මිනුම ඉතා නිවැරදිව ලබා ගැනීමට හැකිය. එනිසා මෙම තාපකය තව දුරටත් භාවිතා කිරීම අවශ්‍ය නොවේ.<br>2. මෙය ක්‍රියාත්මක කිරීම සඳහා වැඩි විදුලි බලයක් අවශ්‍ය වන නිසා වැඩි පිරිවැයක් දැරීමට සිදුවේ.<br>පැරණි ක්‍රමය අනුව ප්‍රතිරෝධ ක්‍රමාංකනය සඳහා තරමක් ඉහළ ධාරාවක් (>5A) අවශ්‍ය බැවින් වැඩි විදුලිබලයක් අවශ්‍ය වේ. එපමණක් නොව ලීටර් 20 පමණ තෙල් ඇති තාපකයේද උෂ්ණත්වය පවත්වා ගැනීමට විශාල විදුලි බලයක් වැය වේ. මේ නිසා පිරිවැය වැඩිවේ.<br>කෙසේ නමුදු දැනට මෙය භාවිතා නොකලද ඉදිරියේදි ගණුදෙනුකරුවන්ගේ (Customers/ Clients) අවශ්‍යතාවය පරිදි පරීක්ෂණ කටයුතු සඳහා භාවිතයට ගත හැක . | |
| (ආ) කාර්මික තාක්ෂණ ආයතනයේ ටොරින්ටන් පරිශ්‍රයේ පිහිටි ප්‍රධාන ගොඩනැගිල්ලෙහි වර්ග අඩි 3,627 ක ප්‍රමාණයක් සහ කාර්යාල හා විද්‍යාගාර ලීබඩු උපකරණ 57 ක ප්‍රමාණයක් 2017 වසරේ සිට නිෂ්කාර්යයව පැවතිණි. | ප්‍රධාන ගොඩනැගිල්ලේ පළමු මහලෙහි කාමර අංක 1231 NVQ පාඨමාලාව හදාරන සිසුන් සඳහා විද්‍යාගාරයක් ස්ථාපිත කිරීමට 2021 වසරේදී කළමණාකාර මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන පාඨමාලාවන් පවත්වන අතර එය සඳහා අවශ්‍ය විද්‍යාගාර උපකරණ ද මෙහි රැස් කොට දැනට පවතින සියලුම පරීක්ෂණාගාර ලී බඩු උපකරණ සමග පාඨමාලාවල අවශ්‍යතාවයන්ට අනුව ඒවා පරිශීලනය කරනු ලැබේ.<br><br>**ප්‍රධාන ගොඩනැගිල්ලේ පළමු මහලෙහි කාමර අංක 1238 සහ බිම් මහලෙහි කාමර අංක 1123**<br>නව Science & Technology (S&T) ව්‍යාපාර මධ්‍යස්ථානය (Business Centre) සඳහා ප්‍රධාන ගොඩනැගිල්ලේ, බිම් මහලේ සහ පළමු මහලේ කාමර කිහිපයක් (1238 සහ 1123 ඇතුලුව) වෙන් කර ඇත.<br><br>ප්‍රධාන ශ්‍රවනාගාරයෙහි හා බිම් මහලෙහි අමුත්තන් පිලිගන්නා අවකාශය තුල Lobby Area අලුත්වැඩියා කටයුතු නිම කොට එම පහසුකම් දැනට S&T Business Centre එක පරිහරනය කරන අතර S&T ව්‍යාපාරික මධ්‍යස්ථානයේ නාම පුවරුවද මේ වන විටත් ස්ථාපනය කොට ඇත. දැනට | කාර්යාලීය ඉඩ ප්‍රමාණයන් හා උපකරණ ඵලදායිව උපයෝජනය කළ යුතුය. |

භාවිතයට නොගෙන ඇතිමුත් භාවිතයට ගත හැකි සියලුම කාර්යාල උපකරණ පවතින ආර්ථික අපහසුතා මත ඉදිරියේදී භාවිතා කිරීමට සැලසුම් කර ඇත.
ප්‍රධාන ගොඩනැගිල්ලේ පළමු මහලෙහි කාමර අංක 1238 හි තිබෙන කාර්යාල ලී බඩු සියල්ල Lab Benches වන අතර එවා පහසුවෙන් ඉවත කල නොහැක. එමනිසා අවශ්‍යතාවය පරිදි පරිහරනය කරනු ලැබේ.

ප්‍රධාන ගොඩනැගිල්ලේ බිම් මහලෙහි කාමර අංක 1123 තිබෙන කාර්යාල ලී බඩු අතර තිබෙන බහුතරයක් විද්‍යා තාක්ෂණ පර්යේෂණ අමාත්‍යාංශයට අයත් හිටපු රාජ්‍ය ඇමතිතුමාගේ කාර්ය මණ්ඩලය විසින් භාවිතා කරන ලද ඒවා වන අතර ආයතනයට අයත් වත්කම් නොවේ. කෙසේ නමුත් අනෙකුත් උපකරණ අතර ඇති Lab Benches 6 පහසුවෙන් ඉවත කල නොහැක. භාවිතා කල හැකි තත්වයේ ඇති දැනට භාවිතා නොවන සභාපතිතුමාගේ කර්යාලයේ පුටු 2 නව ව්‍යාපාරික මධ්‍යස්ථානයේ පරිහරනය සඳහා ප්‍රයෝජනවත් වේ.